# ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගාවේ වර්තමාන තත්ත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ඩබ්.ඒ.අයි.එස්. වික්‍රමආරච්චි*[1]
*ජී.එම්. හේනගෙදර*[2]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ සුළු අපනයන කෘෂි බෝගයන් අතර ඉහළ විදේශ විනිමයක් උපයා දෙනු ලබන භෝගය ලෙස ගම්මිරිස් හඳුන්වා දිය හැකිය. දිවයිනේ හෙක්ටයාර් 32291 ක් පුරා ව්‍යාප්තව පවතින ගම්මිරිස් වගාවෙන් ආදායම් උපයා ගනු ලබන්නන්ගේ ප්‍රමාණය 226000 ක් පමණ වේ. ජාත්‍යන්තර කුළු බඩු වෙළඳාමේ වැඩි ප්‍රමාණයක් හා වැඩි අගයක් හිමි වන බෝගයක් ලෙස ගම්මිරිස් සැලකිය හැකි අතර වාර්ෂික ලෝක ගම්මිරිස් ඉල්ලුම මෙට්‍රික් ටොන් 337500 ක් පමණ වේ. ලෝක ගම්මිරිස් ඉල්ලුමට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ගම්මිරිස් සැපයුම 6% ක් තරම් සුළු ප්‍රමාණයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගාවේ, නිෂ්පාදනයේ සහ වෙළඳපළෙහි වර්තමාන තත්ත්වය කෙසේද යන්න විමර්ශනය කිරීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. ගම්මිරිස් වගාව සම්බන්ධ සාහිත්‍ය විමර්ශනයක් සිදු කිරීම, වගාකරුවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය විමසා බැලීම, වගාවේ ආර්ථිකමය කරුණු සහ වගාකරුවන් මුහුණ දෙන ගැටලු අධ්‍යයනය කිරීම මෙහි අනෙකුත් අරමුණු විය. අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගත් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහන්තේගම ග්‍රාම නිලධාරි වසම තුළින් ගම්මිරිස් වගාකරුවන් 30 දෙනෙකු සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර ප්‍රාථමික දත්ත ලබා ගත් අතර ප්‍රකාශිත පත්‍රිකා, බැංකු වාර්තා පරිශීලනයෙන් ද්විතීයික දත්ත ලබා ගනු ලැබීය.

මෙම අධ්‍යයනය මගින් ගම්මිරිස් වගාවන්හි පැරණි බව නිසා වාර්ෂික අස්වැන්න අඩු වීමේ ප්‍රවණතාවක් පවතින බවත් සුළු පරිමාණ වගා වපසරියක් සහිත වගාකරුවන් බහුල බවත් හඳුනා ගැනිමට හැකි විය. එසේම වයස අවුරුදු 30 ත් 60 අතර වයස් කාණ්ඩයේ ගම්මිරිස් වගාකරුවන් අධ්‍යයන ප්‍රදේශය තුළ බහුල වූ අතර තරුණ පිරිස වගාව සඳහා යොමු වීමක් දක්නට නොලැබුණි. බහුතරයක් වගාකරුවන් තම යැපීම සඳහා වී වගාව සිදු කරන අතර අමතර ආදායමක් උපයා ගැනීම සඳහා ගම්මිරිස් වගාවට යොමු වී ඇත. එසේම පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය යටතේ ගම්මිරිස් අක්කරයක් වගා කර අස්වැන්න ලැබෙන තෙක් නඩත්තු කිරීම සඳහා රුපියල් 231852 ක් වැය වන බවත් එම පිරිවැය ප්‍රතිලාභ වලින් පියවා ගැනීමට ගම්මිරිස් වගාව ආරම්භ කර වසර 9 ක් හා මාස 2 ක් ගත වන බව සොයා ගත හැකි විය. වසර 25 ක ආයු කාලයක් පවතින ගම්මිරිස් වගාවකින් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට නම් වාර්ෂිකව වගාව නිසි ලෙස නඩත්තු කළ යුතු බවත් අනාවරණය විය. අධ්‍යයන ප්‍රදේශය තුළ වගා බිම්වල ඵලදායීතාවය අඩු මට්ටමක පවතින බවත් වගාවන් සඳහා හානි කරන පළිබෝධ හා රෝග පවතින බවත් ඉහළ ආර්ථික වටිනාකමක් සහිත ගම්මිරිස් ආශ්‍රිත වටිනාකම් එකතු කරන ලද නිෂ්පාදන සකස් කිරීම සඳහා යොමු වීමක් දක්නට නොලැබුණි. එසේම ගම්මිරිස් අලෙවි ජාලය තුළ අතරමැදියන් රාශියක් සම්බන්ධව සිටින බවත් ඒ හේතුවෙන් කුඩා පරිමාණ ගම්මිරිස් වගාකරුවා පීඩාවට පත්වන බවත් අනාවරණය විය. ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා බිම් ප්‍රමාණය හා ඵලදායීතාවය ඉහළ දැමීමත් ජාත්‍යන්තර ඉල්ලුමට සාපේක්ෂව ගුණාත්මක බවින් ඉහළ විවිධාංගීකරණයට ලක් වූ ගම්මිරිස් නිෂ්පාදන සකස් කිරීමට පෙළඹීම මගින් ලබා ගත හැකි විදේශ විනිමය ප්‍රමාණය වර්ධනය කර ගත හැකිය.

ප්‍රමුඛ පදඃ ගම්මිරිස් වගාව, නිෂ්පාදනය, ප්‍රතිලාභ, පිරිවැය.

1.ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය ; indeewarisubhashini90@gmail.com

2.ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය